Department of Education Sabaragamuwa Province/ Weekly School

සිංහල භාෂාව හා සාහිත්‍යය

# 17 පාඩම - මහාචාර්ය සේනක බිබිලේ.

## ඉගෙනුම් ඵල -

- ලංකාවේ ශ්‍රේෂ්ඨ චරිත අලලා රචිත චරිතාපදාන ඇසුරු කරයි.
- අදාළ තොරතුරු ඇතුළත් කර පුවත්පතකට ලිපියක් ලියයි.
- පෙළ පොතේ නියමිත පාඩම කියවයි.
- අදාළ වැදගත් තොරතුරු සටහන් කර ගනී.

1. මහාචාර්ය සේනක බිබිලේගේ ජීවන තොරතුරුවල අනුපිළිවෙළ සකස් වන සේ එක් එක් සිදුවීම ඉදිරියේ 1 සිට 20තෙක් සංඛ්‍යා යොදන්න.

I. මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීම. ( )
II. කොළඹ මහ රෝහලේ වෛද්‍යවරයෙකු ලෙස පත්වීම. ( )
III. ඔහුගේ යෝජනාවකට අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවීම. ( )
IV. 1920 පෙබරවාරි 13 දින අහංගම කතළුවේදී උපත ලැබීම. ( )
V. ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම. ( )
VI. උසස් අධ්‍යාපනය සඳහා එඩින්බරෝ විශ්ව විද්‍යාලයට ඇතුළු වීම. ( )
VII. පාසලේ අධ්‍යාපනය ලබන කාලයේ පියාගේ අභාවය සිදුවීම. ( )
VIII. වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීම හා ශිෂ්‍යත්ව දිනා ගැනීම. ( )
IX. බිංගිරියේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධිකාරී තනතුර ලැබීම. ( )
X. වෛද්‍ය විද්‍යාලයේ කථිකාචාර්ය ධූරයක් හිමිවීම. ( )
XI. මඩොල්සිම හා ලුණුගල රෝහල්වල සේවය කිරීම. ( )
XII. පළමු පෙළ සාමාර්ථයක් ලැබ වෛද්‍ය උපාධිය සමත් වීම. ( )
XIII. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වීම. ( )
XIV. හෙට්ටිපොල හා බිංගිරිය ග්‍රාමීය රෝහල්වල වැඩ ආවරණය කිරීම. ( )
XV. ඖෂධ වේදය පිළිබඳ අධ්‍යයනාංශයේ ප්‍රධානියා වීම. ( )
XVI. වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය දෙ අංශයෙන් රන් පදක්කම් හිමිකර ගැනීම. ( )
XVII. අන්ක්ටැඩ් සංවිධානයේ ජ්‍යෙෂ්ඨ ඖෂධ ප්‍රතිපත්ති විශේෂඥයා වීම. ( )
XVIII. 1978 ඔක්තෝම්බර් 8වෙනිදා හදිසියේ අභාවයට පත්වීම. ( )
XIX. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මුල් ම වෛද්‍ය පීඨාධිපති වීම. ( )
XX. එඩින්බරෝ විශ්ව විද්‍යාලයෙන් 1954 දී අචාර්ය උපාදිය ලැබීම. ( )

2. ඔබ අනුපිළියෙල කළ තොරතුරු ඇතුළත් කර පුවත්පතකට සුදුසු ලිපියක් ලියන්න.

# 4 පාඩම - බැද්දේගම

## ➤ ඉගෙනුම් ඵල -

- නූතන ගද්‍ය සාහිත්‍ය කෘතියක් වශයෙන් බැද්දේගම කෘතිය හඳුනාගනී.
- බැද්දේගම කෘතියේ කතුවරයා හා ඔහුගේ වෙනත් කෘති හඳුනාගනී.
- නියමිත 9 පරිච්ඡේදය කියවා එහි ඇතුළත් චරිත හා පරිසර වර්ණනා හඳුනාගනී.

1. සාහිත්‍ය සංග්‍රහය පොතේ ඇති බැද්දේගම නවකතාවෙන් උපුටා ගත් 9වන පරිච්ඡේදය හොඳින් කියවන්න. පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

I. බබුන් සිරගෙට යැවූ දා සිට පුංචි මැණිකා තම ජීවිතය ගැටගසා ගැනීම සඳහා ගත් උත්සාහය පිළිබඳ කෙරෙන විස්තරය උපුටා දක්වන්න.

.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................

II. පුංචි මැණිකාට බෙහෙවින් ම සැනසීම ගෙන දුන්නේ වන ගත ජීවිතය යි. ඇ එය සැනසීමක් කොට සැලකූ අවස්ථාව දැක්වෙන ප්‍රකාශය උපුටා ලියන්න.

.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................
.......................................................................................................